# ගා/ මාපලගම සිරිසුනන්ද මහා විද්‍යාලය

## බුද්ධ ධර්මය

**6 ශ්‍රේණිය** **පළමු වාර පරීක්ෂණය - 2022** **කාලය පැය - 1. වි 30**

**නම:** ........................................................................................................................................................................

**1 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. මනුලොව උපත ලැබීමට ප්‍රථම අප මහා බෝසතාණෝ උපත ලබා සිටියේ

   i. නාග භවනේය  ii. බ්‍රහ්ම ලොවේය
   iii.තුසිත දෙව් ලොවේය  iv. ශක්‍ර භවනේය

2. සිදුහත් කුමරු විවාහ කරගත් යශෝධරා දේවියගේ පියා වූයේ

   i. උදේනි රජතුමා  ii.බින්දුසාර රජතුමා
   iii. සුප්‍රබුද්ධ රජතුමා  iv. කොසොල් රජතුමා

3. දුෂ්කර ක්‍රියාව අත්හළ බෝධිසත්වයෝ අනුගමනය කළ ප්‍රතිපත්තිය නම්

   i. දුෂ්කර තපස් ව්‍රත අනුගමනය කිරීම  ii. සිරුරට අධික ව සැප දීම
   iii. මැදුම් පිළිවෙත අනුගමනය කිරීම  iv. පිඬු සිඟා වැඩීම අත්හැරීම

4. යශෝධරා දේවිය බුදු සිරුර වර්ණනා කරමින් ගායනා කළේ

   i. නිබ්බුත පදය  ii.නරසීහ ගාථාය
   iii. බුදු ගුණ ගාථාය  iv. ජයමංගල ගාථාය

5. මහාමායා දේවිය කළුරිය කළ පසු කුමරු හදා වඩා ගත්තේ

   i. සුජාතා සිටු දේවිය යි  ii. කෝසල දේවියයි
   iii. මහා ප්‍රජාපතී ගෝතමී දේවියයි  iv. බන්දුල මල්ලිකා දේවියයි

6. සිදුහත් කුමරුට ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වූ පඬිවරයා වූයේ

   i. අසිත තවුසා  ii.සර්වමිත්‍ර බමුණා
   iii. කාලදේවල තවුසා  iv. භග්ගව තවුසා

7. සිදුහත් බෝසතාණෝ මව්කුස පිළිසිඳ ගැනීම පිළිබඳ සිහිනය මහමායා දේවිය දුටුවේ

   i. වෙසක් පෝයදාකය  ii. පොසොන් පෝයදාකය
   iii. ඇසල පෝයදාකය  iv. දුරුතු පෝයදාකය

8. පිය රජතුමා සිදුහත් කුමරුට දෙවන වරට වැන්දේ

i. අසිත තවුසා කුමරුට වැන්ද අවස්ථාවේදීය　ii. මව කලුරිය කළ අවස්ථාවේදීය
iii. විවාහ මංගල අවස්ථාවේදීය　iv. වප්මඟුල් අවස්ථාවේදීය

9. ගිහිගෙයින් නික්ම යන විට සිදුහත් කුමරුගේ වයස අවුරුදු

i. 16 කි　ii. 20 කි
iii. 25 කි　iv. 29 කි

10. පන්සලට ගිය පසු වන්දනාමාන කිරීමේදී දෙවනුව වන්දනා කළ යුත්තේ

i. වෙහෙර වහන්සේටය　ii. බෝධීන් වහන්සේටය
iii. පිළිම වහන්සේටය　iv. ජාතක පොත් වහන්සේටය

11. බුදු සසුනේ ශික්ෂාකාමීන් අතර අගතනතුරට පත් වූයේ

i. ආනන්ද හිමි　ii. උපාලි හිමි
iii. රාහුල හිමි　iv. මුගලන් හිමියන්

12. සුවසේ නිදයි, සුවසේ පිබිදෙයි, පාපී සිහින නොදකියි........ ආදී අනුසස් 11ක් ලැබෙන්නේ

i. ආනාපානසති භාවනාව වැඩීමෙනි　ii. මෛත්‍රී භාවනාව වැඩීමෙනි
iii. පිළිකුල් භාවනාව වැඩීමෙනි　iv. බුදුගුණ භාවනාව වැඩීමෙනි

13. එක ඇඟිල්ලක් ඔසවා කුමරු ඒකාන්තයෙන්ම බුදු වන බව පැවසුවේ

i. කොණ්ඩඤ්ඤ තවුසා ය　ii. වප්ප බමුණාය
iii. භද්දිය තවුසාය　iv. අසිත තවුසාය

14. සිදුහත් කුමරුන්ට පැවිදිවීමට සිවුරු පූජා කලේ

i. උදය බමුණාය　ii. සොත්ථිය බමුණාය
iii. ඝටීකාර බ්‍රහ්මණයාය　iv. මහා බ්‍රහ්මයාය

15. දෙවියන්ට පින් පින් දීම සඳහා තිබෙන ගාථාවේ මුල් පද පේළිය වන්නේ

i. ඉදං වෝ ඤාතීනං හෝතු　ii. එත්තාවතාව අම්හේහි
iii. කායේන වාචා චිත්තේන　iv. ඉමිනා පුඤ්ඤ කම්මේන

16. දියුණුවේ රන් දොරටු සඳහන් වන්නේ

i. අත්ථදස්සද්වාර ජාතකයේය　ii. චුල්ල රාහුලෝවාද සූත්‍රයේය
iii. වෙස්සන්තර ජාතකයේය　iv. ස්වර්ණහංස ජාතකයේය

17. "කනවා" යන වචනයට අදාල ශාසනික වචනය තෝරන්න

i. වඩිනවා යන්නයි    ii. වළඳනවා යන්නයි
iii. පැන් පහසු වෙනවා යන්නයි    iv. සැතපෙනවා යන්නයි

18. නොදුන් දෙයක් සොර සිතින් නොගනිමි....... මෙය දැක්වෙන්නේ පන්සිල් වල

i. පළමු සිල් පදයේය    ii. දෙවන සිල්පදයේය
iii. තෙවන සිල්පදයේය    iv. සිව්වන සිල්පදයේය

19. බුදු ගුණ සිහි කරන පාඨය වන්නේ

i. ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ    ii. සුපටිපන්නෝ භගවතෝ
iii. ඉතිපි සෝ භගවා අරහං    iv. සද්ධාය සම්පදිත්තේන

20. සිදුහත් බෝසතාණෝ දුෂ්කරක්‍රියා කළ කාලය වසර ගණන

i. 6 කි    i. 5 කි
i. 4 කි    i. 7 කි

## II කොටස

1. කෙටි පිළිතුරු සපයන්න

    I. පංච මහා විලෝකනය නම් කරන්න.
    II. කුඩා සිදුහත් කුමරු උගත් ශිල්ප දෙකක් නම් කරන්න.
    III. සිදුහත් කුමරු දුටු සතර පෙර නිමිති මොනවද?
    IV. නිබ්බුතා නූන සා මාතා...... මෙය සම්පූර්ණ කරන්න.
    V. පස්වග තවුසන් නම් කරන්න.

2.

    I. සත්‍ය සොයා යාමේදී සිදුහත් තවුසාණෝ හමුවූ ගුරුවරුන් පිළිවෙලින් නම් කරන්න.
    II. ත්‍රිවිද්‍යා නම් කරන්න.
    III. සිදුහත් කුමරුගේ චරිතයෙන් ශිෂ්‍යයෙකුගේ ජීවිතයට ගත හැකි ආදර්ශ ලියන්න.

3.

    I. රාහුල හිමි රහත් භාවයට පත් වුයේ කුමන සූත්‍රය අසා ද?
    II. බුදුරජාණන් වහන්සේ රාහුල හිමියන්ට ධර්මය දේශනා කිරීම සඳහා යොදාගත් උපමා දෙක ලියන්න.
    III. රාහුල හිමිගේ චරිතයෙන් අපට ගත හැකි ආදර්ශ ලියන්න.

4.

    I. දියුණු වීමේ දොරටු තුනක් ලියන්න.
    II. දියුණුවේ දොරටුවක් ලෙස හඳුන්වන "අලීනතා" යන්නෙහි තේරුම ලියන්න.
    III. දියුණුවීම සඳහා අප ඇත් විය යුතු දේ මොනවාද?

5.

    I. මෛත්‍රී භාවනාව වැඩීම සඳහා පිරිමි සහ ගැහැණු හිඳගත යුතු පර්යංක දෙක පිරිවෙන් ලියන්න.
    II. මෛත්‍රී භාවනාව වැඩීමෙන් මෙලොව දී ලැබෙන අනිශංස තුනක් ලියන්න.
    III. මෛත්‍රී භාවනාව වඩන ආකාරය ලියන්න.